සියලුම හිමිකම් ඇවිරිණි }
All Rights Reserved }

# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## ஊவா மாகாண கல்வித் திணைக்களம்
## Uva Provincial Department of Education

## ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය - 2026

| I පත්‍රය | විදුහල : මො/මල්වත්තාවල ප්‍රාථමික විද්‍යාලය. | කාලය: පැය 01යි. |
|---|---|---|

විභාග අංකය ..........................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්**

- ඔබගේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර** මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40 ක්** ඇත.
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවල තිත් ඉර මත පිළිතුරු ලියන්න.
- පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවලනිවැරදි පිළිතුරු තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.
- කටු වැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| අවසාන ලකුණු | |
| එකතුව ඉලක්කමෙන් | |
| එකතුව අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| පළමුවන පරීක්ෂක<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි. | V/I/S |
| දෙවන පරීක්ෂක<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි | V/I/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක<br>ඇගයීම කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව සහතික කරමි. | V/I/S/EMF |
| ප්‍රධාන පරීක්ෂක<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණු නිවැරදිය. | V/I/S/CH |


සකස් කළේ : තිලක් වීරසිංහ මයා
විදුහල : මො/මල්වත්තාවල ප්‍රාථමික විද්‍යාලය.


පරීක්ෂා කළේ : ඩබ්ලිව්.ජී.සරත් ගමගේ මයා
විදුහල : මො/ චන්ද්‍රවිමල ප්‍රාථමික විද්‍යාලය.

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**


**පහත අංක 1 ප්‍රශ්නයේ මුලින් දී ඇති රිපයට සමාන රූපය තෝරන්න.**

**01.**






1





2




3


**02.** **විනිවිද පෙනෙන කඩදාසි පටි මත A හා B රූප ඇඳ ඇත. A පටිය මත B පටිය තබා ඇති නිවැරදි ආකාරය වන්නේ,**








**1**




**2**




3

3


**03.** අවස්ථා තුන අනුපිළිවෙළට දැක්වෙන පිළිතුර තෝරන්න.



**A**



**B**



**C**

1. A B C
2. C A B
3. C B A

විභාග අංකය ........................................

**04.** පහත සඳහන් වාක්‍ය නිවැරදිව සම්පූර්ණ වීමට තිබිය යුතු වචන ඇතුළත් පිළිතුර තෝරන්න.
හොඳ දරුවන් ලෙස අපි ................................ හා ............................... දේ හොඳින් තෙරුම් ගෙන ........................ දේ කරන්නටත් ........................... දේ නොකරන්නටත් පුරුදු වෙමු.

1. නොකළ යුතු , කළ යුතු . නොකළ යුතු, නොකළ යුතු
2. කළ යුතු . නොකළ යුතු, කළ යුතු . නොකළ යුතු
3. නොකළ යුතු, කළ යුතු . කළ යුතු . නොකළ යුතු

**05.** ගමින් ගමට මල් කැකුළු පිපෙන විට මගේ රට හරි සුවඳයි.සමන් මලක් වී පිපෙන්න ආසයි - මගේ මේ ගේ මිදුලේ. මෙම කවියේ අදහස වන්නේ,

1. හැකි සෑම නිවසකම සමන් මල් වගා කළ යුතු බවය.
2. හොඳ ගතිගුණ ඇති යහපත් ළමයෙකු විය යුතු බවය.
3. සමන් මල්වල වටිනාකම මෙන් ළමයාගේ වටිනාකමද වැඩිවිය යුතු බවයි.

**06.** ඉංග්‍රීසි අකුරු ගලපා අර්ථවත් වාක්‍යක් සකස් කරන්න.

| | | |
|---|---|---|
| අවස්ථාවකි - B | අපට - D | ස්වර්ණමය - E |
| ඇත්තේ - C | ලැබී - A | |

1. BCEDA  2. DACEB  3. DACBE

**07.** "කළුවා මාරපන් ගියා වගේ" යන යෙදුම පැහැදිලි කරන ප්‍රකාශය කුමක්ද?

1. නුසුදුසු ගමනක නිරත්වීම.
2. විමසීමකින් තොරව යමක් කිරීම.
3. උදෑසනින්ම ගමනක් පිටත්ව යෑම

**08.** බස් රථයක ගමන් කළ පිරිමි සංඛ්‍යාව ගැහැනු සංඛ්‍යාව මෙන් දෙගුණයකි.එම බස් රථයේ ගමන් කළ පිරිමි සංඛ්‍යාව විය හැක්කේ,

1. 32  2. 33  3. 37

**09.** සුමාලි හා විමාලි නිවුන් සොහොයුරියන් දෙදෙනෙකි.සුමාලි විමාලිට බාල වන්නෙ මිනිත්තු 30ක කාලයකින් ය. මේ දෙදෙනාගේ උපන් දින පිළිබඳව නිවැරදි නොවන්නේ කුමන ප්‍රකාශයද?

**1.** 2025 වසරේ ජනවාරි 30 හා 31 විය.


**2.** 2025 වසරේ දෙසැම්බර් 31 හා 2026 වසරේ ජනවාරි 01 විය.

**3.** 2025 වසරේ ජනවාරි 31 හා 2025 වසරේ දෙසැම්බර් 31 විය

**10** රැස්වීම් ශාලාවක යොදා ඇති ආසනවල අංක 200 සිට 400 දක්වා ඇත.ඒ අතරින් 2 හා 5 යන ඉලක්කම් එක ළඟ යෙදෙන අංක සහිත ආසන කීයක් තිබේද?

**1.** 12 **2.** 13 **3.** 14

**11.** රූප තුළ සංඛ්‍යා යෙදී ඇති ආකාරය අනුව හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව සොයන්න.




**1.** 91 **2.** 19 **3.** 92

**12.** රථ ගාලක නවතා ඇති වෑන් රථ සහ ත්‍රීරෝද රථ ගණන 25 කි. එම වාහන වල මුළු රෝද ගණන 85 ක් වේ නම්, එහි ඇති ත්‍රී රෝද රථ ගණන හා වෑන් රථ ගණන පිළිවෙලින්,

**1.** 15 , 10 **2.** 10 , 15 **3.** 12 , 11

**13.** අයිස්ක්‍රීම් එකක මිල යෝගට් එකක මිලෙන් අර්ධයකි.වටලප්පන් එකක මිල අයිස්ක්‍රීම් එකක මිලට සමානය.වර්ග තුනෙන්ම 1 බැගින් මිල දී ගත් විට මිල රුපියල් 320.00ක් විය.අයිස්ක්‍රීම් එකක මිල කීයද?

**1.** රු. 80.00 **2.** රු. 75.00 **3.** රු. 85.00

**14.** නිමල් , අමල් , සමන් කර්මාන්ත ශාලාවක සේවය කරයි.ඔවුන් සතියේ දිනකදී වැඩ කරන කාල පරාසය පහත දැක් වේ. එම තොරතුරු වලට අනුව දිනකදී වැඩිම වේලවක් වැඩ කරන්නේ කවුද?

| නම | පෙරවරු | පස්වරු |
|---|---|---|
| නිමල් | 6.30-10.45 | 2.00-5.15 |
| අමල් | 8.00-10.30 | 2.30-5.30 |
| සමන් | 6.45-11.00 | 2.30-5.00 |

**1.** නිමල්

**2.** අමල්

**3.** සමන්

**15.** ක්‍රීඩා පිට්ටනියක් වටා කොඩි කණු සිටුවා ඇත්තේ පිළිවෙලින් රතු , කහ , කොළ වර්ණවලින් ය. එහි 13 වන , 18 වන හා 27 වන කොඩි විශේෂ අවිශ්‍යතාවයක් නිසා ඉවත් කිරීමට සිදු විය. ක්‍රීඩා පිටිය වටා සිටුවා ඇති මුළු කොඩි ගණන 40 ක් නම් රතු , කහ , කොළ වර්ණවලින් ඇති කොඩි ගණන පිළිවෙලින් සඳහන් පිළිතුර තෝරන්න.

**1.** 13 , 13 , 12 **2.** 14 , 13 , 11 **3.** 13 , 13 , 11

**16.** ප්‍රශ්න 25 කින් යුත් ප්‍රශ්න පත්‍රයක සෑම නිවැරදි පිළිතුරකටම ලකුණු 4ක් ලැබෙන අතර වැරදි පිළිතුරු සඳහා ලබා ගත් ලකුණු වලින් 2ක් අඩු කරයි.නිවැරදි පිළිතුරු 15ක් ලියූ සිසුවෙකුට ලැබෙන ලකුණු ගණන වන්නේ,

**1.** 45 **2.** 40 **3.** 35

**17.** පහත කවියේ පද පිළිවෙල නිවැරදිව ගළපා ගත හැකි පිළිවෙල වන්නේ,

**A** - මාලේ මුතු ඇට වාගේ

**B** - හදමු එකක් ඒ වාගේ

**C** - මගෙ සුරතල් අක්කාගේ

**D** - මේ වැටෙන්නේ පිණි බින්දුයි.

**1.** CDBA **2.** CADB **3.** ACBD


**18.** දැනුම මිනුම තරඟයකට සහභාගී වූ පූජනීට ප්‍රශ්න 7ක් ලැබුණි.පළමු ප්‍රශ්නයට ලකුණු 10ක් ද , දෙවන ප්‍රශ්නයට ලකුණු 15 ක් ද , තුන්වන ප්‍රශ්නයට ලකුණු 20ක් ද, වන රටාවට ඔහුට ලකුණු ලැබුණි.ඔහු ලකුණු 135ක් ලබා ගත්තේ නම් ඔහුට පිළිතුරු දීමට නොහැකි වූ ප්‍රශ්නය වන්නේ.

**1.** පස්වන **2.** අටවන **3.** හතරවන

**19.** සිද්ධියක අවස්ථා තුනක් පිළිවෙලට දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

**1.** රෙදි මදියි , සොදයි , වනයි. **2. උයයි, බෙදයි , කයි** **3.** සපත්තු දමයි , පසල් යයි , ඇඳුම අදියි

**20. වවුලා , නිශාචර සතුන් සහ දිවාචර සතුන් අතර සම්බන්ධය නිවැරදිව දැක්වෙන රූප සටහන වන්නේ,**



**1.** **2.** **3.**

**21.** වෘත්තාකාර ක්‍රීඩා පිටියක සමාන දුරක් සිටින ලෙස කොඩි කණු සිටුවා ඇති අතර 9 වන කණුව ඉදිරියේ 3 වන කණුව සිටුවා ඇත.මෙහි ඇති කණු ගණන කීයද?

**1.** 16 **2.** 14 **3.** 12

**22.** සුනිල් පඩි පෙළක හත්වන පඩිය මත සිටියි.එම පඩි පෙළේ ඉහල සිට බැලූ විට එය තුන්වන පඩියයි.එම පඩිපෙළ මැද පඩියේ සුපිපි සිටියි.එසේ නම් සුනිල් හා සුපිපි අතර ඇති පඩි ගණන කීයද?

**1.** 1 **2.** 2 **3.** 3

**23.** සේරසිංහ මහතාට දූවරු දෙදෙනෙක් සිටිති.ඒ සෑම දුවෙකුටම සහෝදරයෝ දෙදෙනෙක් සිටිති.ඒ අනුව සේරසිංහ මහතාට සිටින දරු දැරියන් සංඛ්‍යාව වන්නේ,

**1.** 4 **2.** 5 **3.** 6

**24.** මල්ලි ප.ව. 5.30 සිට ප.ව. 8.30 දක්වා ද, අයියා ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා ද, තාත්තා ප.ව. 5.30 සිට ප.ව. 6.30 දක්වා ද රූපවාහිනිය නරඹයි.ඔවුන් තිදෙනාම එකවර රූපවාහිනිය නරඹන කාලය කොපමණද?

**1.** මිනිත්තු 30 **2.** පැය 1 මිනිත්තු 30 **3.** මිනිත්තු 60


**25.** එක්තරා යන්ත්‍රයකට සංඛ්‍යාවක් ඇතුළත් කළ විට පළමුව 5 න් ගුණ වේ.ඉන් පසුව 7 ක් අඩු වේ.පසුව 13 ක් එකතු වේ.පසුව 2න් බෙදේ.ඉන් පසුව අවසාන සංඛ්‍යාව පිට වේ.ඇතුළත් කළ සංඛ්‍යාව 12 නම් පිට වූ සංඛ්‍යාව කීයද?

**1.** 25 **2.** 22 **3.** 33

**26.** පොකුණක සෑම උදෑසනකම නෙළුම් මල් 5 ක් පිපෙන අතර සවස ඉන් දෙකක් පර වී යයි.පොකුණේ නෙළුම් මල් 20 ක් දැකගත හැකි වන්නේ කී වැනි දවසේ ද?

**1.** 3,4,6 **2.** 4,3,2 **3.** 6,4,3

**27.** මෙම රූපයේ ඇති ත්‍රිකෝණ ගණන කීයද?




**1.** 20


**2.** 08

**3.** 18

**29.** නිහාල් ළඟ සෙල්ලම් ගෙඩි යම් ප්‍රමාණයක් ඇත.එය යහළුවන් හත්දෙනෙකු අතර සමානව බෙදා දිය හැකිය.අට දෙනෙක් අතර බෙදා දුන් විට සෙල්ලම් ගෙඩි හතරක් ඉතිරි වේ.නිහාල් ළඟ ඇති සෙල්ලම් ගෙඩි ගණන වන්නේ,

**1.** 16 **2.** 24 3. 28

**29.**  +  = රු. **20.00**

 -  = රු. **4.00**

- ඉහත තොරතුරු අනුව මකනයේ මිල වන්නේ,

**1.** රු.4.00 **2.** රු.12.00 **3.** රු. 8.00

**30.** දින 31 ක් ඇති මාසයක ආරන්භක දිනය බදාදාවකි.එසේනම් ඊලඟ මාසයට ඇති අඟහරුවාදා දින ගණන කීයද?

**1.** 4 **2.** 6 **3.** 5


**31.** මීටර් 5 ක් දිග කම්බියකින් පැත්තක දිග 5 **cm වූ සමචතුරස්‍ර කීයක් සාදාගත හැකිද?**

**1.** 15 **2.** 25 **3.** 30

**32.** මීටර් 5 ක් දිග මීටර් 4 ක් දිග බිත්තියක ගෑමට තීන්ත ලීටර් 5 ක් අවශ්‍ය වේ.ඒ අනුව මීටර් 10ක් දිග මීටර් 1 පලල බිත්තියක ගෑමට අවශ්‍ය තීන්ත ප්‍රමාණය කොපමණද?

**1.** 1.5 ℓ **2.** 1 ℓ **3.** 2.5 ℓ

**33.** ත්‍රිකෝණ එක මත එක තබා ඇති රූපයක් මෙහි දැක් වේ.එහි පාට කර ඇති කුඩා ත්‍රිකෝණයේ වටේ දිග 9 **cm** කි.ඒ අනුව ලොකු ත්‍රිකෝණයේ වටේ දිග කීයද?



**1.** 24 cm

**2.** 36 cm

**3.** 118 cm

**34.** එක ළඟ ඇති සංඛ්‍යා දෙකක් එකිනෙක ගුණ කළ විට සෑම විටම ලැබෙන්නේ,

**1.** ඉරට්ටේ සංඛ්‍යාවකි.

**2.** ඔත්තේ සංඛ්‍යාවකි.

**3.** ඉරට්ටෙ හෝ ඔත්තේ සංඛ්‍යාවකි.

**35.** ළමයෙක් තම නිවසේ සිට 4 km ක් දකුණට ගොස් එතනින් නැගෙනහිරට හැරී තවත් 4 km ක් ගොස් එතනින් උතුරට හැරී 4 km ක් ද නැවත නැගෙනහිරට හැරී 4 km ක් ද ගමන් කරයි.දැන් ඔහු සිටින තැනට ඔහුගේ නිවසේ සිට සෘජු දුර කොපමණද?

**1.** 8 km  **2.** 16 km  **3.** 12 km


**36.** පළමු දා 2024 වර්ෂයේ පෙබරවාරි 25 වැනි සඳුදා නම් ඉන් අනිද්දා සහ පෙරේදා පිළිවෙලින් කවදාද?

**1.** පෙබරවාරි 26 අඟහරුවාදා , මාර්තු 1 සෙනසුරාදා

**2.** පෙබරවාරි 27 බදාදා , මාර්තු 3 සඳුදා

**3.** මාර්තු 2 ඉරිදා , පෙබරවාරි 26 අඟහරුවාදා

**37.**




පොත් සාප්පුවක තිබූ පොත් පිළිබඳ මෙම ප්‍රස්ථාරයේ දැක්වේ.එහි ඉංග්‍රීසි පොත් සංඛ්‍යාව 30ක් නම් , ගණිතය හා විද්‍යා පොත් ගණන කීයද?

**1.** 60 , 90  **2.** 90 , 120  **3.** 90 , 60

**38.** 1 ත් 100ත් අතර ඇති සංඛ්‍යාසියල්ල ලිවීමේදී එම සංඛ්‍යා සමූහයේ 5හේ ගුණාකාරයන් වන එහෙත් 10 ගුණාකරයන් නොවන සංඛ්‍යා කීයක් තිබේද?

**1.** 20  **2.** 19  **3.** 10

**39.** වෙළෙන්දෙක් විකිණීම සඳහා අඹ ගෙඩි යම් ප්‍රමාණයක් ඒවායින් $\frac{2}{7}$ ක් තැලී ඇති නිසා ඉවත් කර ඉතිරි ගෙඩි සියල්ල සමාන ගොඩවල් 4ට වෙන් කළේ ය.එක් ගොඩක ගෙඩි 15ක් තිබුණි නම්,ඔහු ගෙනා මුළු අඹ ගෙඩි ගණන කොපමණද?

**1.** 84  **2.** 81  **3.** 60

**40.** එකක් රුපියල් 80.00බැගින් අන්නාසි ගෙඩි ප්‍රමාණයක් මිල දී ගත් වෙළෙන්දෙක් එම අන්නාසි ගෙඩි සියල්ල එකක් රු.100.00බැගින් විකුණා රු.1000.00 ක ලාභයක් ලැබීය. ඔහු අළෙවි කළ අන්නාසි ගෙඩි ගණන කීයද?

**1.** 30  **2.** 45  **3.** 40

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## ஊவா மாகாண கல்வித் திணைக்களம்
## Uva Provincial Department of Education

## ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය - 2026

| II පත්‍රය | විදුහල : මො/මල්වත්තාවල ප්‍රාථමික විද්‍යාලය. | කාලය: පැය 1 මිනිත්තු 15 |
|---|---|---|

විභාග අංකය ......................................

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ **ප්‍රශ්න 60 ක් ඇත.**
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න** (සමහර ප්‍රශ්නවල අනු කොටස් ද ඇත.)
- පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවල **තිත් ඉර මත** පිළිතුරු ලියන්න.
- පිළිතුරට යටින් **ඉරක් අඳින්න** යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.
- කටු වැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| අවසාන ලකුණු | |
| එකතුව ඉලක්කමෙන් | |
| එකතුව අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමුවන පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | <br>V/II/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි | <br>V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව සහතික කරමි. | <br>V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>**අධීක්ෂණය කළෙමි.**<br>**අවසාන ලකුණු නිවැරදිය.** | <br>V/II/S/CH |

*සකස් කළේ : තිලක් වීරසිංහ මයා*
*පාසල : මො/මල්වත්තාවල ප්‍රාථමික විද්‍යාලය.*

*පරීක්ෂා කළේ : ඩබ්ලිව්.ජී.සරත් ගමගේ මයා*
*පාසල : මො/ චන්ද්‍රවිමල ප්‍රාථමික විද්‍යාලය.*

**01.** පහත සඳහන් ඡේදය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දඹදිව රජගහ නුවර 'ජීවක' නම් කුමාරයෙක් විසී ය.වයස අවුරුදු අටක් පමණ වූ කල ඔහු මෙසේ සිතුවේ ය. ''මගේ අනාගත ජීවිතය සාර්ථක කර ගැනීමට හොඳ අධ්‍යාපනයක් ලැබිය යුතුය'' තක්සලා නුවර දිසාපාමොක් ඇදුරුතුමා වෙත ගිය ජීවක වෛද්‍ය ශාස්ත්‍රය ඉගෙනීමට ඇති වුවමනාව කියා පෑවේ ය. එතුමා යටතේ ජීවක සත් අවුරුද්දක් උගත්තේ ය.

**i.** ගුරුතුමා යන්නට සමාන පදයක් **ඡේදයෙන් සොයා ලියන්න.** ........................................................

**ii.** ජීවක අධ්‍යාපනය ලැබීමට ගියේ කවුරුන් වෙත ද? ........................................................

**iii.** ඡේදයට අනුව අනාගත ජීවිතය සාර්ථක කර ගැනීමට ලැබිය යුත්තේ කුමක්ද? ........................................

........................................................................................................................

**iv.** මහප්‍රාණ අකුරක් සහිත වචනයක් තෝරා ලියන්න. ........................................................

**v.** ''ශාස්ත්‍රය'' යන වචනය තුළ ඇති පිල්ලම් නම් කරන්න. ........................................................

**vi.** ''අපේ'' යන්නෙහි ඒක වචන පදය සොයා ලියන්න ........................................................ (ල 1x6=6)

**02.** පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාතය සම්බන්ධය නිවැරදි නම් ✔ ලකුණ ද වැරදි නම් ✘ ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

**i.** නිමල් හොඳින් ක්‍රීඩා කළෝ ය. ( )

**ii.** දිය පහර වේගයෙන් ගලයි. ( )

**iii.** ගුරුතුමා පාඩම කියා දෙයි. ( )

**iv.** සීයා උදෑසන ම පුවත්පත කියවති. ( )

**v.** අපි පන්සල් වත්ත පිරිසිදු කරමු. ( ) (ල 1x5=5)

**03.** පහත වචන ගළපා අර්ථවත් වාක්‍යක් ගොඩ නගන්න

(වෙනුවෙන් / දරුවන්ගේ / ආරක්ෂාව / නිරන්තරයෙන් / වෙහෙසුණා ය / එතුමිය)

........................................................................................................................ (ල 1x1=1)

**04.** පහත වැකියේ වැරදි ලෙස ලියා ඇති වචන පමණක් නිවැරදි කර හිස්තැනෙහි ලියන්න.

ලේකන කලාවේ ආරම්බය හා වියාප්තිය පිළිබඳව දැනුවත් විය හැකි බොහෝ දේ මෙහි තැන්පත් කර තිබෙයි. ........................................................................................ (ල 1x3=3)

**05.** බහු වචන අතීතකාල ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න.

**i.** පනිති. **ii.** ගියෝ ය. **iii.** සෙව්වේ ය. (ල 1x1=1)

**06.** **i.** පහත පදයේ විරුද්ධාර්ථ පදය ලියන්න.

පුහුණු - ..............................................

**ii.** පහත පදයේ ස්ත්‍රී ලිංග පදය ලියන්න.

නළුවා - .............................................. (ල 1x2=2)

විභාග අංකය ..........................................

**07.** **i.** පහත ඉඟි වැකියේ තේරුම ලියන්න.

- ඉහේ මලක් පිපුණා

..........................................................................................................................

**ii.** පහත අදහස දෙන ආප්තෝපදේශය ලියන්න.

- උගත් ශිල්පය ම මතු ආරක්ෂාව සලසයි.

.................................................................................................................. (ල 1x2=2)

**08.** නිවරදිව පද බෙදා වාක්‍ය නැවත ලියන්න.

- වෙලමැ දසිටු වා ඇතිප ඔයාගේහි සමත ඇතිබෙ ලෙක්තො ජ්පියදි ලිසෙමින්තිබේ.

..........................................................................................................................

.................................................................................................................. (ල 1x2=2)

**09.** පහත වැකි ලිඛිත බසට හරවා ලියන්න.


**i.** ඇය දක්ෂ ලෙස රඟපෑවා. - ..........................................................................

**ii.** තාත්තා කුඹුරේ වැඩ කරනවා.- ..................................................................

**iii.** රෑ අහසේ තරු බබළනවා. - ............................................................ (ල 1x3=3)

**10.** එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

**i.**



| | | | | |
|---|---|---|---|---|
| | | | | |

**ii.**



| | | | |
|---|---|---|---|
| | | | |

(ල 1x2=2)

**11.** පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

**i.** do/How/have/many/Brothers/you

..........................................................................................................................

**ii.** a/house/she/small/has

..........................................................................................................................(ල 1x2=2)

**12.** එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය බැගින් ලියන්න.

**i.** bed room - ............................... **ii.** Triangle - .......................................(ල 1x2=2)

**13.** දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

- මුහුණ සෝදන්න - ........................................................................................ (ල 1x1=1)

**14.** පහත වාක්‍යයේ සිංහල අර්ථය ලියන්න.

- අණ්ණාමාර් ඉරුක්කිරාර්හළ් - ........................................................................................ (ල 1x1=1)

**15.** 85 425 සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න. ..........................................................................................

**16.** එකස්ථානය 6 , දහයස්ථානය 0 , සියස්ථානය 4 , දහසස්ථානය 5 දස දහසස්ථානය 8 වන සංඛ්‍යාව කුමක්ද?

..........................................................................................................................................................

**17.** පහත සංඛ්‍යා අවරෝහණ පටිපාටියට ලියන්න.

66 635 , 66 693 , 66 936 - ............................ ............................ ............................

**18.** පොත් වෙළඳසැලක ළමා කතා පොත් 3 752ක් ද, නව කතා පොත් 3 638ක් ද, විද්‍යා ප්‍රබන්ධ පොත් 735ක් ද ඇත.එහි මුළු පොත් සංඛ්‍යාව කීයද? ..........................................................................................

**19.** පහත සංඛ්‍යා රටාව සම්පූර්ණ කරන්න.

...................... , ...................... , 87 , 94 , 101 , 108


**20.** වෙළෙන්දෙකු ළඟ අඹ ගෙඩි 295 ක් තිබුණි.එයින් ගෙඩි 187 ක් විකුණුවේ නම් ඉතිරි අඹ ගෙඩි ගණන කොපමණද? ..........................................................................................................................

**21.** මිනිසුන් තුන් දෙනෙකුට පැණි බීම 750 ml ප්‍රමාණවත් වේ නම් මිනිසුන් 7 දෙනෙකුට අවශ්‍ය පැණි බීම ප්‍රමාණය කොපමණද? ..................................................................................................................

**22.** නාමල්ට අත් ඔරලෝසුවක් මිලදී ගැනීමට තව රුපියල් 425.00ක් අවශ්‍ය වේ. **අත් ඔරලෝසුවේ මිල රුපියල් 1 150.00 ක නම් ඔහු ළඟ තිබූ මුදල කීයද?** ..........................................................................................

**23. කුඩා පැන්සල් පෙට්ටියක පැන්සල් 6ක් ද, විශාල පැන්සල් පෙට්ටියක පැන්සල් 12ක් ද, දැමිය හැකිය. රුවන් මේ ආකාරයේ පැන්සල් සහිත කුඩා පෙට්ටි 10කුත් විශාල පෙට්ටි 15කුත් මිලදී ගත්තේ ය. ඔහු මිලදී ගත් මුළු පැන්සල් ගණන කොපමණද?** ..........................................................................................

**24.**



**i.** පාට කර ඇති ප්‍රමාණය භාග සංඛ්‍යාවක් ලෙස ලියන්න.


..........................................................................................

**ii.** $\frac{1}{2}$ ක් ලෙස පාට වීමට තවත් කොටස් කීයක් පාට කළ යුතුද?

..........................................................................................

25. කොන්ත්‍රාත්කරුවෙක් පළමු මාසයේ **20km 240m** දුරට ද, තවත් සති දෙකකින් **16km 850m** දුරට ද පාරක් කාපට් අතුරා සකස් කරයි. වැඩ නිම කරන විට කාපට් ඇතිරූ මුළු දිග කොපමණද?

.............................................................................................................................................

26.  පාට නොකළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

.............................................................................................

27. අයියා නිවසට පැමිණියේ ප.ව.6.30ටයි. මම අයියා පැමිණි වේලාවේ සිට පැය 2 ක් පාඩම් කළ අතර මා පාඩම් කර නිම වූ වේලාව ඩිජිටල් ඔරලෝසුවේ දැක්වෙන ආකාරයට කොටුව තුළ ලියන්න.

28. **12 kg** ක් වූ තේ කොළ වලින් **750 g** පැකට් **8**ක් සාදන ලදි. ඉතිරි තේ කොළ ප්‍රමාණය ග්‍රෑම් වලින් ලියන්න. .............................................................................................

29. එක්තරා ගමකට සහනාධාර ලෙස ලැබුණු පොත් **636**ක් එක් දරුවෙක් සඳහා පොත් **3** බැගින් දරුවන් කී දෙනෙක් වෙත බෙදා දිය හැකිද? ..........................................................................

(ල 2x15=30)

- අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර පහත පිළිතුරු අතරින් තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

30. පාසල් ළමුන් තුළ සරල වාම් පැවත්මක් පුරුදු කිරීම වෙනුවෙන් අනුගමනය කර ඇති දෙයකි.
   1. එකම ආකාරයේ පොත් කවර දැමීම.
   2. එකම වර්ගයේ නිල ඇඳුම් ලබා දීම.
   3. එකම වර්ගයේ පාසල් බෑග් ලබා දීම.

31. ඔබ නිසා අන් අය අපහසුතාවයට පත්විය හැකි අවස්ථාවකි.
   1. පාඩම් සඳහා අවශ්‍ය දෑ රැගෙන ඒම.
   2. පාසල් බස් රථ තුළ විනීතව හැසිරීම.
   3. පන්තියේ අධික ශබ්දයෙන් කථා කිරීම.

32. "කෑමට කෑදර කම නොකරන්නේ" යන කවිය ඇතුළත් වන්නෙ.
   1. සුභාෂිතය  2. මගේ රට  3. සිරිත් මල්දම

33. ජලය ප්‍රමාණවත් ලෙස පානය නොකළ විට,
   1. ක්‍රියාශීලී වේ.  2. සිරුර මළානික වේ.  3. ප්‍රාණවත් සිරුරක් ලැබීම.

**34.** ශ්‍රී ලංකාව සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,

1. බහු සංස්කෘතික රටකි.
2. ඉන්දියන් සාගරයේ ඉන්දියාවට උතුරින් පිහිටා ඇත.
3. බහු ආගමික රටකි.

**35.** ශ්‍රී ලාංකිකයන්ගේ ආගන්තුක සත්කාර ගැන අගය කල අයෙකි.

**1.** ජේම්ස් ටේලර් මහතා **2.** රොබට් බ්‍රවුන්‍රිග් මහතා. **3.** රොබට් නොක්ස් මහතා

**36.** මෙම බීම බෝතලය සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශය වන්නේ.




**1.** අධික සීනි මට්ටමක් ඇත.

**2.** අවම සීනි මට්ටමක් ඇත.

**3.** සාමාන්‍ය සීනි මට්ටමක් ඇත.

**37.** ඒක දේශික ශාක වර්ග දෙකකි.

**1.** ගොඩපර , හොර **2.** පොල් , පයිනස් **3. හීන් බෝවිටියා , දෙල්**

**38.** පාද අටක් , පාද රාශියක් හා පාද හතරක් පිළිවෙළින් ඇති සතුන් වන්නේ.

**1.** මකුළුවා , පත්තෑයා , මීයා **2.** මදුරුවා , මීයා , පත්තෑයා **3.** මකුළුවා, පත්තෑයා , වළි කුකුළා

**39.** මැඩුවන් වලින් බැත වෙන්කර ගැනීමට පැරණි ගොවියා භාවිත කරන ලද්දේ.






**1.** **2.** **3.**

**40.** වැව් බැම්මක පාමුල පළල වැඩිවන ලෙස සකසා ඇත්තේ.

**1 .** එය තුළින් වැඩි ජල ප්‍රමාණයක් රඳවා ගත හැකි නිසා.
**2.** පතුලේ පීඩනය **වැඩි නිසා.**
**3.** වැව් බැම්ම මත වාහන ගමන් කිරීම සඳහා.

**41.** **මෙම බල්බය**



**1 .** දැල් වේ.

**2.** නොදැල් වේ.

**3.** ඇතැම් විට දැල් වේ.

42. අධිවේගී මාර්ගයක ඇති දැන්වීම් පුවරුවල පසුබිම් වර්ණය වන්නෙ.

1. සුදු 2. කොළ 3. නිල්

43. ශ්‍රී ලංකාවේ දකුණු දිශාවේ ඇති ජාත්‍යන්තර ගුවන්තොටුපළක් වන්නේ,

1. කටුනායක ගුවන්තොටුපළ 2. මත්තල ගුවන්තොටුපළ 3. වීරවිල ගුවන්තොටුපළ


44. එක් රටක සිට තවත් රටකට යෑම සඳහා අනිවාර්යෙන් සෑම මගියෙකු ළඟ ම තිබිය යුත්තේ,

1. ජාතික හැඳුනුම්පත 2. බැංකු ගිණුමට අදාළ කාඩ්පත 3. විදේශ ගමන් බලපත්‍රය

45. ස්පර්ශවන පෘෂ්ඨ අතර සුමට බව අඩුකර ගන්නා අවස්ථාවකි.
1. ස්කුරුප්පු ඇණ සවිකරන විට ඇණයේ සබන් තැවරීම
2. බයිසිකල් දම්වැලට තෙල් හෝ ග්‍රීස් දැමීම.
3. වාහන ටයර්වල කට්ටා කැපීම.

46. 2025 වසරේ අපේ රටට බලපෑ ස්වභාවික ආපදා දෙකකි.
1. ගං වතුර හා නාය යාම් 2. සුළි සුළං හා භූමි කම්පා 3. නාය යාම් හා සුනාමි

47. දණ්ඩ චුම්බක දෙකක ධ්‍රැව ලංකළ විට සිදුවන දෙය පිළිබඳව සාවද්‍ය පිළිතුර වන්නේ.




1.ආකර්ෂණය වේ

2. විකර්ෂණය වේ.

3. ආකර්ෂණය වේ

48. කොවිඩ් 19 හෙවත් කොරෝනා වෛරසය ආරම්භ වූයේ,
1. ඉන්දියාවෙනි 2. චීනයෙනි 3. ග්‍රීසියෙනි

49. වික්ටෝරියා , කොත්මලේ හා ලක්ෂපාන යනු,

1. තාප විදුලි බලාගාර වේ. 2. ජල විදුලි බලාගාර වේ. 3. සුළං විදුලි බලාගාර වේ.

50. පාසලේ ප්‍රථමාධාර කඳවුරක් පැවැත්වීමට උදවු ගත හැකි ආයතනය වන්නේ,

1. ප්‍රාදේශීය සභාව 2. කලාප අධ්‍යාපන කාර්යාලය 3. රතුකුරුස සංවිධානය

51. ගෙවත්තේ කෘමි පාලනය සඳහා යොදාගත හැකි දෙයකි.
1. අළු යෙදීම 2. වැලි යෙදීම 3. රෙදි සෝදන කුඩු යෙදීම

**52.** නිකුත්කල පුද්ගලයාට පමණක් භාවිතයට වලංගු වන අන් සතු කළ විට නීතියෙන් දඩුවම් ලැබෙන රජයේ ආයතනයකින් නිකුත් කරන ලද්දකි.

**1.** බැංකු පොත **2.** රක්ෂණ ඔප්පුව **3.** ජාතික හැඳුනුම්පත

**53.** සුළඟ මගින් ව්‍යාප්තිය සිදුවන ශාක වන්නේ,

**1.** පුවක් , පොල් , බඩ ඉරිඟු **2.** හොර , තොටිල , වරා **3.** තෙල් එඩරු , අඹ, ගම්මාලු

**54.** විවිධ උත්සව සඳහා කෙසෙල් ගස සැරසිල්ලක් ලෙස භාවිතයට ගන්නේ,

**1.** ද්‍රවිඩ ජාතිකයින් **2.** **මුස්ලිම් ජාතිකයින්** **3.** **සිංහල ජාතිකයින්**

**55.** ජල වාෂ්පවලින් ගන්නා ප්‍රයෝජනයක් නොවේ.

**1.** පිට්ටු , ඉදි ආප්ප වැනි දේ සාදා ගැනීම.

**2.** මහා පරිමාණයෙන් වී තම්බා ගැනීම.

**3.** **ජලය පිරිපහදු කර ගැනීම.**

**56.** **අධිවේගී මාර්ගය හා එහි වර්ණය සිතියම්වල දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ.**

**1.** | E 01 | රතු

**2.** | A-9 | දම්

**3.** | E 01 | දම්

**57.** 3R සංකල්පය යනු

**1.** අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ක්‍රමවේදයකි.

**2.** වැඩ පහසු කර ගැනීමේ ක්‍රමවේදයකි.

**3.** මතක තබා ගැනීමේ ක්‍රමවේදයකි.

**58.** ක්ලාන්ත වූ අයෙකුට නොකළ යුත්තේ,

**1.** සිසිල් ජලය පෙවීම. **2.** හිස පහතට වන සේ හාන්සි කර වීම. **3.** තදට ඇති ඇඳුම් බුරුල් කිරීම.

**59.** **සීගිරි කැටපත් පවුරේ දැකගත හැක්කේ,**

**1.** **බිතු සිතුවම්** **2.** **කුරුටු ගී** **3.** **රජවරු පිළිබඳ තොරතුරු** (ල 1x30=30)

**60. වර්තමානයේ තාක්ෂණය සෑම අංශයක් කරාම පැතිරී ගොස් ඇත. ඒ අතරින් සුහුරු(smart) ජංගම දුරකතනය ඉතා ජනප්‍රිය මාධ්‍යයකි. ජංගම දුරකතනය තුළින් පුංචි අපිට ලබාගත හැකි ප්‍රයෝජන පිළිබඳව වැකි තුනක් ලියන්න. උක්ත ආඛ්‍යාතය නිවැරදිව ගැළපිය යුතු අතර එක් වැකියකට වචන පහකට නොඅඩු විය යුතුය.**

01 ..............................................................................................................

..............................................................................................................

02 ..............................................................................................................

..............................................................................................................

03 ..............................................................................................................

.............................................................................................................. (ල 3x2=6)